වෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව

වවුනියාව දිස්ත්‍රික්කය.

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

---------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 27 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ 2013 ජුලි 10 දින ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ඔක්තෝබර් 28 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ සඳහන් කරුණු වලින් මූල්‍ය ප්‍රකාශයන්ට වන බලපෑම් හැර, 2013 දෙසැම්බර් 31 දිනට වෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාවේ වැඩකටයුතු වල තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන පරිදි පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශයන් සමග මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා යොදාගත් ගිනුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-------------------------------

ලේඛනය අනුව අයභාර ආදායම් රු.25,036,898 ක් වූ අතර ප්‍රාදේශීය සභා ආකෘති පත්‍ර 16 අනුව එම ප්‍රමාණය රු.21,385,391 ක් වූයෙන් රු.3,651,507 ක වෙනසක් දැක්විණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.101,804,469 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

(අ) ඉකුත් වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා වල දක්වා තිබූ භාවිතා කළ නොහැකි විෂයයන් සම්බන්ධයෙන් සභාව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂවරයාගේ අංක 438 හා 2009 නොවැම්බර් 13 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව රු.9,000 ක් වූ අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 දක්වා නිරවුල් කර නොතිබුණි.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.15,921,667 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.17,637,686 ක් විය.

2.2 ලැබිය යුතු ගිණුම්

------------------------

2013 දෙසැම්බර් 31 දින වනවිට එක් නිලධාරියෙකුගෙන් වර්ෂ 10 කට අධික කාලයක් අයනොවී පැවති රු.20,806 ක ශේෂයක් පැවතිණි.

2.3 ආදායම් පරිපාලනය

-------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

--------------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| --- | --- | --- | --- |
| | රු. | රු. | රු. |
| වරිපණම් සහ බදු | 1,990,000 | 3,488,703 | 479,907 |
| බලපත්‍ර ගාස්තු | 1,125,000 | 704,400 | 3,891,083 |
| වෙනත් ආදායම් | 42,343,380 | 20,843,795 | 43,700 |
| එකතුව | 45,458,380 | 25,036,898 | 4,414,690 |

2.3.2 උසාවි දඩ

--------------

2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ මුදල රු.2,696,933 ක් විය.

2.3.3 හිඟ ආදායම්

----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා අයවිය යුතු කඩකුලී සහ වාහන කුලී හිඟය 2013 දෙසැම්බර් 31 දිනට රු.87,931 ක් වු අතර මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත වත්කම්

--------------------------------------------

සභාව විසින් සාකච්ඡා ශාලාව සඳහා මිලදී ගත් රු.45,000 ක් වටිනා වේදිකාව ගබඩාවේ නිෂ්ක්‍රීයව තබා තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

(අ) සභාව සතු ජේ.සී.බී. මෝටර් ග්‍රේඩර්ස් අයකිරීමකින් තොරව අදාළ පාර්ශවයන් විසින් පාවිච්චි කර තිබුණු අතර ඒ සඳහා අයවිය යුතු මුදල රු.246,350 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට රු.1,040,243 ක් වු ජංගම ගිණුම් ශේෂයක් වර්ෂයකට අධික කාලයක් අක්‍රීයව තිබුණි.

.

(ඇ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවි යුතු රු.5,255,807 ක් වු ණය සඳහා සනාථ කිරීමේ ලිපිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

4. පද්ධති සහ පාලන

------------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සඳහා සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් පාලනය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) අත්තිකාරම් පාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) ගිණුම්කරණය